දෙවන වාර අවසාන ඇගයීම් - 2011

මාරිස් ස්ටෙල්ලා විදුහල- මීගමුව

| 7ශ්‍රේණිය | පෙරදිග සංගීතය | කාලය පැය 2 යි |
|---|---|---|

නම :......................................................... ශ්‍රේණිය :...................... අංකය :......................

උපදෙස් -

- නිවරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

.

**I කොටස**

1) සප්තකයේ මුළු ස්වර සංඛ්‍යාව .
 I. ස්වර 7 කි.
 II. ස්වර 5 කි.
 III. ස්වර 12 කි.
 IV. ස්වර 8 කි.

2) කෝමළ ස්වර හැඳින්වීමට .
 I. ස්වරය යටින් තිතක් තබයි.
 II. ස්වරය යටින් ඉරක් තබයි
 III. ස්වරය උඩින් තිතක් තබයි
 IV. කිසිඳු ලකුණක් නොතබයි

3) පෙරදිග සංගීතයේදී මූලික වශයෙන් ස්වර සප්තක,
 I. 2ක් භාවිත වේ
 II. 3ක් භාවිත වේ.
 III. 7ක් භාවිත වේ.
 IV. 9ක් භාවිත වේ

4) වයලීනය අයත් භාණ්ඩ වර්ගය වන්නේ ,
 I. තත් භාණ්ඩ ගණයට
 II. අවනද්ධ භාණ්ඩ ගණයට
 III. සුෂිර භාණ්ඩ ගණයට
 IV. ඝන භාණ්ඩ ගණයට

5) බටනලාවේ සියලුම සිදුරු විවෘත කළ විට උපදින ස්වරය වන්නේ,.
 I. පංචමය.
 II. මධ්‍යමය.
 III. තීව්‍ර මධ්‍යමය
 IV. ගන්ධාරය.

6) සරිග ,රිගම ,ගමප , ................යන්නෙහි ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය වන්නේ
 I. පධනි
 II. මධනි
 III. මපධ
 IV. ධනිස

7) ස්වර අභ්‍යාස ගායනය හෝ වාදනය ප්‍රධාන වශයෙන්ම
 I. ආධුනිකයෙකුට වැදගත් වේ
 II. ගායකයෙකුට වැදගත් වේ
 III. වාදකයෙකුට වැදගත් වේ
 IV. සංගීතඥයෙකුට වැදගත් වේ.

8) අත් තැලීමට සිත පෙළඹෙන සේ පද සකස් වී ඇති ගීත,
 I. ආඝාතාත්මක ගීත නම් වේ
 II. අනාඝාතාත්මක ගීත නම් වේ
 III. ස්වර ස්ථාපන ගීත නම් වේ
 IV. සර්ගම ගීත නම් වේ.

9) "ලය"ප්‍රධාන වශයෙන් ප්‍රභේද,
 I. 2 කි
 II. 3 කි
 III. 7 කි
 IV. 5 කි

10)වයලනයේ තත් 4 පිළිවෙළින්,
 I. DAGE
 II. AEGD
 III. EADG
 IV. EGDA

- සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

11)වයලින් පවුලේ කුඩාම භාණ්ඩය.............................................................................................වේ.

12)බටහිර සංගීතයේ කෝමල ස්වර හදුන්වන්නේ..........................................................සංකේතයෙනි

13)තාලයේ වේගය ...................................................................................යනුවෙන් හැඳින්වේ.

14)පෙර අපර දෙදිග එකසේ ප්‍රචලිත වාද්‍ය භාණ්ඩයකි...................................................................

15)බටනලා වාදනයේදී සිදුරු සඳහා දෑතේ ඇඟිලි.......................................................ක් උපයෝගී වේ.

පහත වාක්‍ය නිවරදි නම්(√) ලකුණද වැරදි නම් (x) වැරදි ලකුණද යොදන්න.

16)සප්තකයක විකෘති ස්වර 5 ක් ඇත ( )
17)සුෂිර වාද්‍ය භාණ්ඩයක් ලෙස බටනලාව ගත හැක. ( )
18)දන්නෝ බුදුන්ගේ ගීතය අඩු ලයකින් ගායනා කෙරේ. ( )
19)ඈ s ත/හි මේ s /හි රි මු/දු නේ s ගීතය මාත්‍රා 3න් 3නට ගායනා වේ. ( )
20)බටනලාව සඳහා මුරලි හා බන්සුරි යන නම් භාවිත වේ. ( )

## II කොටස

උපදෙස්ඃ

- ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.



1)

I. ඉහත දක්වා ඇති වයලීනයේ ඊතල මත අදාල කොටස් නම් කරන්න.

2)

I. ඔබ ඉගෙන ගත් ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්ථාර කොට ලියා දක්වන්න

II. ස්වර සප්තකය යනු කුමක්දයි පැහැදිලි කරන්න.

3)

I. දරු නැලවිලි ගී පිළිබඳ කරුණු 5ක් විස්තරාත්මකව ලියන්න.

II. ඔබ ඉගෙන ගත් දරු නැලවිලි ගීයක් පද ප්‍රස්ථාර කොට ලියන්න..

4)

I. පහත සඳහන් ස්වර අභ්‍යාස ආරෝහණ අවරෝහණ වශයෙන් ලියන්න
ග රි ස රි ග .......................
ස්̇ නි ධ නි ස්̇.......................

II. පෙරදිග සංගීතයේ ස්වර සප්තකයට අදාල ස්වර සංකේත වෙනුවට බටහිර සංගීතයේ ස්වර සංකේත යොදා ලියන්න..

5)

I. ස්වර පුවරුව ඇඳ ස්වර (12)ලකුණු කරන්න.

II. ස්වර පුවරු සංගීත භාණ්ඩ 5ක් නම් කරන්න.

**(ලකුණු 15 x 4 =60)**